# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2074/21 - 2018 ජුනි මස 06 වැනි බදාදා - 2018.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වන සංරක්ෂණ ආඥාපනත**

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත (451 වැනි අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත (451 වැනි අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත උපලේඛනය සහ එහි මායිම් තුළ පිහිටි හෙක්ටයාර් ප්‍රමාණය 9.9807 ක් වූ විශාලත්වයෙන් යුතු **ශාස්ත්‍රවේලි (කඩොලාන කැළේ)** වනාන්තරය වර්ෂ 2018 ක් වූ ජුනි මස 05 වැනි දින සිට **ශාස්ත්‍රවේලි (කඩොලාන කැළේ) රක්ෂිත වනාන්තරය** ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**මෛත්‍රීපාල සිරිසේන,**
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2018 ජුනි මස 05 වැනි දින,
බත්තරමුල්ල,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4065 — 82 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ශාස්ත්‍රවේලි (කඩොලාන කැළේ) වනාන්තරයට අයත් ශාස්ත්‍රවේලි ගමේ භූ.මු.පි. 19 හි කැබලි අංක 3669, 3670, 3671 ශාස්ත්‍රවේලි කැළේ නමැති ඉඩම් ඒකාබද්ධ මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 9.9807 ක විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | භූ.මු.පි. 19 හි කැබලි අංක 3156 ද; |
| නැගෙනහිරට | : | භූ.මු.පි. 19 හි කැබලි අංක 3156, කැබලි අංක 3157, කැබලි අංක 3672 ද; |
| දකුණට | : | භූ.මු.පි. 19 හි කැබලි අංක 3672 ද; |
| බස්නාහිරට | : | භූ.මු.පි. 19 හි කැබලි අංක 3672, කැබලි අංක 3156 ද. |

| | | |
|---|---|---|
| ප්‍රමාණය | : | හෙක්ටයාර 9.9807 |

06 - 836

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.